**වත්තල මාබෝල නගර සභාව**

**------------------------------**

**ගම්පහ දිස්ත්‍රික්කය**

**--------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 18 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 29 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වත්තල මාබෝල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට පැවති භෞතික තොගයේ වටිනාකම ගිණුම් ගත කළයුතු වුවත් රු.2,755,642 ක් වූ ලෙජර ශේෂය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | භෞතික තොගයේ වටිනාකම ගිණුම් ගත කළ යුතු වේ. | ශේෂ නිවැරැදි කිරීමේ ව්‍යාපෘති වාර්තාවේ නිර්දේශ මත රු.241,737ක ශේෂයක් අතැති තොග හා පොදු ගබඩා ගිණුමෙන් ඉවත් කිරීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ රු.597,296 කට මිලදී ගෙන තිබූ පුස්තකාල පොත් තොගයක් සඳහා ලැබූ රු.77,236 ක වට්ටම සමඟ ප්‍රාග්ධනිත කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැළපීම් කර නිවැරදි කළ යුතු වේ. | පුස්තකාල පොත් ගිණුම්ගත කිරීමේදී පොතේ සඳහන් වටිනාකමට ගිණුම්ගත කර ඇත. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 61,255,165 ක වෙනසක් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. | මෙම ශේෂයන් නිවැරදි කිරීමට කටයුතු කරමින් පවති. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | 2018 දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් ගිණුමේ වූ රු.394,951ක හර වටිනාකම ලේඛන මඟින් තහවුරු නොවූ අතර හඳුනාගෙන නිරවුල් කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ශේෂ නිවැරදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම ශේෂය නිවැරැදි කිරීමට කටයුතු කරමින් පවති. |
| (ii) | 2012 වර්ෂයේදී පෙර ගෙවීම් ලෙස කොන්ත්‍රාත්කරුවෙකුට වෙත ලබාදී තිබූ වර්ෂ 06 ඉක්ම වූ රු.95,074ක වටිනාකමක් අවසන් බිල්පතෙන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගතිමි.මෙය ඉදිරියේදී නිවැරුදි කිරීමට කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.55,166,020 ක්වූ ගිණුම් විෂයන් 03 කට අදාල සාක්ෂි ඉදිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සංනිරීක්ෂණය/සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ . | ශේෂ නිවැරදි කිරීමේ ව්‍යාපෘතිය යටතේ මෙම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,475,628 | වර්ෂ 02 ඉක්මවූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.43,238,320 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,176,255 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 | රු.`000 |
| (i) | වරිපනම් හා බදු | 56,065 | 56,198 | 46,935 | 40,944 | 55,801 | 55,951 | 53,299 | 52,070 |
| (ii) | කුලී | 14,600 | 11,467 | 15,357 | 10,076 | 14,022 | 11,242 | 15,112 | 18,589 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 400 | 835 | 872 | - | 450 | 461 | 1,396 | - |
| (iv) | වෙනත් ආදායම් | 82,878 | 85,277 | 85,277 | - | 79,090 | 35,070 | 35,070 | - |

2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය සඳහා දේපල තහනම් කිරීමේ නිලධාරීන් පත්කර නොතිබූ අතර හිඟ වරිපනම් අයකිරීම සඳහා සභාව විසින් අඩු දායකත්වයක් දක්වා තිබුණි. | හිඟ වරිපනම් අය කර ගැනීම සඳහා කටයුතු කළ යුතු වේ. | 2019 පෙබරවාරි 20 දින දේපළ තහනම් කිරීමේ නිළධාරින් දෙදෙනෙක් පත්කර ආදායම් අයකර ගැනීම වැඩි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2018 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ආදායම වූ රු.52,070,000 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.23,254,449 ක් අයකරගෙන තිබූ බැවින් හිඟ වරිපනම් අයකිරීම් ප්‍රතිශතය සියයට 46.17ක් වැනි අඩු මට්ටමක පැවති අතර මෙයින් ආයතන 02 කින් පමණක් අයවිය යුතු මුදල රු.ලක්ෂ 43 ක් විය. | දේපල තහනම් කිරීමේ නිවේදන නිකුත් කර හිඟ වරිපනම් ගෙවීමට දිරිගැන්විය යුතුවේ. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |

2.2.3 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 වන දිනට නගර සභාව සතු බාලහේන වත්ත නිවාස 29 කින් රු.945,540 ක හිඟ නිවාස කුලිය අයකර ගැනීමට පියවර ගෙන නොතිබූ අතර මෙයින් නිවාස 09 කට පමණක් නීතිමය පියවර ගෙන තිබුණි. | හිඟ නිවාස කුළී අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගෙවීම් පැහැර හැර ඇති රු.50,000 ට වැඩි හිඟ ශේෂ හිමි 09 දෙනෙකු සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට 2018 සැප්තැම්බර් 05 දින සභා අනුමැතිය පරිදි එන්තරාවාසි යැවීම සඳහා නීතිඥ මහතා වෙත භාරදී ඇත. |
| (ආ) | නගර සභාව සතු හැඳල හංදිය ඇල අයින ඉඩම් කොටසෙහි කඩ කාමර ඉදිකර ගැනීම සඳහා මෙයට වර්ෂ 15 කට පෙරදී පුද්ගලයින් 06 දෙනෙකුට බදු දී තිබූ අතර 2017 ජුනි මස වන විට මේවායේ බදු කාලය අවසන් වී තිබුණි. සභාව විසින් නැවතත් වර්ෂ 15 කට එම පුද්ගලයින්ටම කඩ කාමර බදු දීමට තීරණය කළද කඩ කාමර 04 ක් සඳහා 2019 අප්‍රේල් මාසය වන විටත් ගිවිසුම්ගත වී නොතිබුණි.ඒ වන විට හිඟ කඩ කුලී රු.189,000 ක් ගෙවා නොතිබූ අතර එම කඩ කාමරවල සන්තකය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් ප්‍රකාර කටයුතු නොකරන කඩ නැවත සභාවට ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 04 ක් සඳහා මේ වන විට ගිවිසුම් අත්සන් කර ඇති අතර, මිය ගිය අයෙකුට අයත් කඩ කාමර 04 ක් සඳහා ගැටලුකාරී තත්වයක් ඇතිවීම නිසා ගිවිසුම්ගත වීම ප්‍රමාද වී ඇත. සෙසු කඩ කාමර 04 හි සන්තකය පවරා ගැනීම සඳහා 2019 මාර්තු 15 දින සභාවේ අනුමැතිය ලැබී ඇති අතර,ඒ අනුව ඉදිරි කටයුතු කරමින් පවතී. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 01 දිනට හිඟ කුලී ආදායම වූ රු.18,589,000 කින් සමාලෝචිත වර්ෂය තුළ රු.10,882,968ක් අයකරගෙන තිබූ බැවින් හිඟ කුලී අයකිරීම් ප්‍රතිශතය සියයට 58.6 ක් විය. | හිඟ කුලී අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩි කළ යුතුවේ. | ඉතිරි හිඟ අයකිරීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ඈ) | වාර්ෂිකව ටෙන්ඩර් කැඳවීමකින් තොරව මාබෝල වෙළඳ සංකීර්ණයේ අංක 03 දරන කුකුළු මස් කඩය, මාසික රු.32,000 ක කුලී පදනම යටතේ 2018 සැප්තැම්බර් 01 සිට 2021 අගෝස්තු 31 දක්වා වූ වර්ෂ 3 ක කාල සීමාවක් සඳහා බදුදී තිබුණි. | ටෙන්ඩර් කැඳවීමෙන් බදු දීම කළ යුතු වේ. | වසර 03 ක් සඳහා ටෙන්ඩර් කිරීම 2018 ජූලි 06 දිනැති සභා තීරණය අනුව සිදුකර ඇති අතර, සභාවට මූල්‍යමය පාඩුවක් සිදු නොවන පරිදි වාර්ෂිකව සියයට 10 කින් බදු කුලී වැඩිවීමේ පදනම මත ලබා දී ඇත. |

2.2.4 වෙනත් ආදායම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **කුළුණු ආදායම** | | |
| 2018 දෙසැම්බර් 31 දින වන විට සන්නිවේදන කුළුණු 02 කින් රු.114,667 ක වරිපනම් අය කර නොතිබුණි. | සභාවේ ආදායම් නියමිත කාලය තුළ අය යුතුවේ. | හිඟ බදු ගෙවන ලෙස අදාල ආයතන වෙත දැනුම් දී ඇත. 2019 වසරේ 3 වන කාර්තුව අවසන් වීමට පෙර හිඟ මුදල් අයකර අවසන් කිරීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ක්‍රියාකාරී සැලැස්මේ පොදු පහසුකම් සංවර්ධනය යටතේ ක්‍රියාකාරකම් 04 ක් දක්වා තිබූ අතර එක් ව්‍යාපෘතියක් 2017 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කළ ව්‍යාපෘතියක් විය. තවත් ව්‍යාපෘතියක් ඉටු කර නොතිබූ අතර | ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක විය යුතුවේ. | හැඳල වෙළඳ සංකීර්ණය අළුත්වැඩියා කිරීම සඳහා 2017 වර්ෂයේ සිදු කර ඇති අතර හැඳල හන්දියේ අනවසර කඩ ඉවත් කිරීම හා හැඳල නව ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා සැලසුම් සකස් කිරීම සිදු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | 2018 නොවැම්බර් 09 වන විට ඉතිරි ව්‍යාපෘති දෙක සඳහා සැලසුම් පමණක් සකසා තිබුණි. | | |
| (ii) | ක්‍රියාකාරි සැලැස්මේ කාර්යාල ගොඩනැගිලි සංවර්ධනය යටතේ ක්‍රියාකාරකම් 03 ක් ඉටුකිරීමට සැලසුම් කර තිබුණද 2018 නොවැම්බර් 09 දින වන විට සැලසුම් සකස් කිරීම පමණක් සිදු කර තිබුණි. | සැලසුම් අනුව කටයුතු කළ යුතු වේ. | කාර්යාල ගොඩනැගිල්ල සඳහා සූර්ය කෝෂ මගින් විදුලිය ජනනය කිරීමේ ව්‍යාපෘතිය, පාතිමා පාර ක්‍රීඩා පිටිය ඉදිකිරීම, LED වර්ගයේ දැන්වීම් පුවරුවක් සවිකිරීම සහ පෙරටු කාර්යාලය ඉදිකිරීම් ඉදිරියේදි ඉටුකිරීමට කටයුතු කරමි. |

(ආ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය අනුව 2015-2030 කාලය තුළ ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනා ගෙන එම අරමුණු හා ඉලක්ක මැනීම හා නියාමනය කිරීම සඳහා දර්ශක හඳුනා ගැනීම, පාදක දත්ත හඳුනා ගැනීම හා වාර්ෂික ඉලක්ක හඳුනා ගැනීම හා එහි ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්ම 2019 මාර්තු 15 දින පළාත් පාලන අමාත්‍යාංශය සහ පළාත් පාලන කොමසාරිස් (බස්නාහිර පළාත) වෙත යොමු කර ඇත. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------- | -------------------- |
| (අ) | 2017 වර්ෂයේ හැඳල වෙළඳ සංකීර්ණයේ අලුත්වැඩියා කටයුතු ඉටු කිරීම වෙනුවෙන් රු.1,921,486 ක් වැය කර තිබූ අතර නැවත 2018 වර්ෂයේදී එම ගොඩනැගිල්ල ඉවත්කර අලුතින් ඉදිකිරීමට සැලසුම් කර තිබුණි. ඒ අනුව පෙර වර්ෂයේ දරන ලද වියදම අනාර්ථික වී තිබුණි. | සැලසුම්කරණයේදී වඩා සැලකිළිමත් විය යුතුවේ. | වෙළඳ සංගමයෙන් මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කිරීම හේතුවෙන් හැඳල වෙළඳ සංකීර්ණය අත්‍යාවශයෙන්ම ඉටු කළ යුතු කාර්යයක් වූ බැවින් එය ඉටු කරන ලදි. |
| (ආ) | නගර සභාවට අයත් පෙර පාසැල තාවකාලිකව පවත්වාගෙන යාම සඳහා රු.65,000 ක මාසික කුලියක් යටතේ ගොඩනැගිල්ලක් සපයා ගෙන තිබූ අතර ප්‍රසම්පාදන කොන්දේසි ප්‍රකාරව ගොඩනැගිල්ලේ ආරක්ෂිත බව, සනීපාරක්ෂක පහසුකම් හා ස්ථානයට | ගොඩනැගිල්ලේ පහසුකම් සම්බන්ධයෙන් සලකා බැලිය යුතුවේ. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමිය වාචිකව දැනුවත් කිරීම් කර ඇති අතර,ඉදිරි කටයුතුවලදී ලිඛිතව අධිකාරි බලය ලබා ගෙන කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| ප්‍රවේශවීමේ මාර්ග පහසුකම් සම්බන්ධයෙන් සළකා බලා නොතිබුණි. | | |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සේවකයන් 98 ක ගෙන් අයවිය යුතු රු.255,830 ක සේවක ණය ශේෂය දිගු කාලයක සිට අය නොවී පැවතුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.282,741 ක් වූ සේවක ණය ශේෂයෙන් රු. 251,466 ක මුදලක් කපා හැරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කර ඇත. |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වර්ෂය සඳහා පිළියෙල කරන ලද අයවැය ලේඛනය අනුව ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා නඩත්තු යටතේ රු.19,000,000 ක් වෙන්කර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වසර සඳහා මෙය සකස් කිරීමට කටයුතු කරමි. |